8. ගරු ලක්ෂමන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු ධීවර, මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට: ( ප්‍ර/vi(1)/16/43 )

(අ). (i) පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ නිල වාහන සඳහා හිමිකම් ලබන නිලධාරීන් 05 දෙනෙකු සඳහා 2013 වර්ෂයට අනුමත ඉන්ධන සීමාව ඉක්මවා රු.7,413,016.00 ක ඉන්ධන ලබා දී ඇති බව ඔබතුමා දන්නෙහිද ?

(ii) එම නිලධාරීන්ගේ නම් සහ තනතුරු කවරේද?

(ආ). (i) නිල වාහනයක් භාවිත කිරීම සඳහා විධිමත් අනුමැතිය ලබා නොගත් නිලධාරීන් 22 දෙනෙකුද නිළ වාහන භාවිතා කර ඇති බව දන්නෙහිද?

(ii) එම නිලධාරීන්ගේ නම් සහ තනතුරු කවරේද?

(ඇ). 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා රු.5,297,864.00 ක ඉන්ධන භාවිතා කර ඇති බව දන්නෙහිද?

(ඈ). අනුමත මාසික කුලී සීමාව ඉක්මවා කුලී වාහනයක් සඳහා රු.2,760,000.00 ක් 2011 සහ 2013 වර්ෂ සඳහා ගෙවීම් කර ඇති බව පිළිගන්නේද?

(ඉ). ඉහත (අ), (ආ), (ඇ), (ඈ) තොරතුරු වලට අනුව පළාත් සභාවට සිදුව ඇති මූල්‍ය පාඩුව කීයද?

(ඊ). මෙම පාඩු වෙනුවෙන් වගකිව යුත්තන් කවුරුන්ද?

(උ). අදාළ වගකිව යුත්තන් වෙනුවෙන් ගන්නා ක්‍රියාමාර්ග මොනවාද?

9. ගරු ලක්ෂමන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු ධීවර, මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට: ( ප්‍ර/vi(1)/16/44 )

(අ). වර්ෂ 2011-2013 කාලය තුළ බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සේවය කළ නිළධාරීන් 04 දෙනෙකු තමා සතු පෞද්ගලික වාහන ආයතනයට කුලියට ලබා දී එම නිලධාරීන්ම භාවිත කර තිබූ බව දන්නේද ?

(ආ). එම නිළධාරීන් 04 දෙනාගේ නම් හා තනතුරු කවරේද?

(ඇ) ලබාගෙන ඇති මාසික කුලිය කීයද?

(ඈ). අදාල කාලය තුළ කුලී වශයෙන් ඔවුන්ට ගෙවා ඇති මුළු මුදල කීයද?

(ඉ). මෙය කවර ගණයේ වැරැද්දක් ලෙස සලකන්නේද?

